ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධිපන්තිය සඳහා වන සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය

(රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/02-01-34/04/2017 හා 2021.08.10 දිනැති ලිපිය අනුව 1.1, 1.2, 1.4, 1.6, 7.4.2.3, 7.4.2.5 සහ 7.4.5 වගන්ති සංශෝධනය කර ඇත.)

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
යොමු අංකය : ජාලේ 7/1/3/ 1 දිනය : 2017.03.02
DNA/2/MA7/2/11 දිනය : 2020.10.23

1.2 අමාත්‍යාංශය : අධ්‍යාපන අමාත්‍යාංශය
යොමු අංකය : ED/5/67/26/02/13 දිනය : 2017.04.11
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
යොමු අංකය : CA/1/1/18/6/1 දිනය : 2020.12.21

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : DMS/1135 Vol - I දිනය : 2016.09.15
DMS/1135 Vol - I 2017.02.08
DMS/1135 Vol - I 2017.02.17

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය : EST-02/RECRU/02/0295 දිනය : 2017.06.05
EST-02/RECRU/02/0295 දිනය : 2019.09.19

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය : NSCC/5/38/SR (තාවකාලික) දිනය : 2017.05.31

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
යොමු අංකය : PSC/EST/02-01-34/04/2017 දිනය : 2017.11.28
PSC/EST/02-01-34/04/2017 පළමු සංශෝධනය : 2021.08.06

02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) අධිපන්තිය

3.2 ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මඟින් බඳවා ගනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක/ සුභසාධ්‍යකාරක/ උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/ පිරිස් කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN 7 –2016

5.2 වැටුප් පරිමාණය : රු.41,580 – 11x755 –18x1030 – රු.68,425

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

ශ්‍රේණිය	ආරම්භක වැටුප් පියවර	ආරම්භක වැටුප් තලය (රු.)
විශේෂ	පියවර 04	43,845/-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 පරිදි වැටුප් ගෙවනු ලැබේ.

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

අනුමත තනතුරු නාමය	තනතුර අනුමත ශ්‍රේණිය	අනුමත තනතුරු සංඛ්‍යාව	කාර්යයන්
ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (අධිලේඛන)	විශේෂ	01	• ශිල්පීය අංශයේ අධිලේඛන සංරක්ෂණ අධීක්ෂණ නිලධාරී හා සියළුම අධිලේඛන සංරක්ෂකවරුන්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය කිරීම හා ඔවුන්ට රාජකාරී පැවරීම, ලේඛන ප්‍රතිසංස්කරණය, සංරක්ෂණය හා පොත් බැඳීම සම්බන්ධයෙන් බාහිර පුද්ගලයින්ට හා ආයතන වෙත අවශ්‍ය උපදෙස් ලබා දීම. • අංශයේ උපකරණ මනා ලෙස නඩත්තු කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම, දෙපාර්තමේන්තුවේ තැන්පත් ලේඛනවල ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය විද්‍යාත්මක උපදෙස් ලබාදීම සහ පියවර ගැනීම, ජාතික ලේඛනාගාර නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ), ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ (තාක්ෂණ, ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් ලේඛන) සහ ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී ඉටු කිරීම.
ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය)	විශේෂ	01	• ශ්‍රව්‍ය දෘශ්‍ය අංශයේ ශ්‍රව්‍ය දෘශ්‍ය යන්ත්‍රෝපකරණ නඩත්තු කටයුතු පිළිබඳ උපදෙස් ලබා දීම, ශ්‍රව්‍ය දෘශ්‍ය සංරක්ෂකවරුන්ගේ රාජකාරී අධීක්ෂණය, ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන පවත්වාගෙන යාම සහ සංරක්ෂණය පිළිබඳව විද්‍යාත්මක උපදෙස් ලබා දීම, එම ලේඛනවල ආරක්ෂාව සම්බන්ධයෙන් පියවර ගැනීම • රාජ්‍ය ආයතනවල ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන පවත්වාගෙන යාම පිළිබඳව උපදෙස් ලබා දීම හා ජාතික ලේඛනාගාර නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය), ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ (තාක්ෂණ, ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් ලේඛන) සහ ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී ඉටු කිරීම.
ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (චිත්‍රපට)	විශේෂ	01	• චිත්‍රපට අධිලේඛනාගාර අංශයේ චිත්‍රපට පවත්වාගෙන යාමට හා චිත්‍රපට තත්ත්ව පරීක්ෂාවන් ඉටු කිරීමට අවශ්‍ය සියලු තාක්ෂණික හා විද්‍යාත්මක උපදෙස් ලබා දීම, එම අංශයේ යන්ත්‍රෝපකරණ නඩත්තු කටයුතු පිළිබඳ උපදෙස් දීම, චිත්‍රපට සංරක්ෂකවරුන්ගේ රාජකාරී අධීක්ෂණය, දෙපාර්තමේන්තුවේ තැන්පත් චිත්‍රපටවල ආරක්ෂාව සම්බන්ධයෙන් පියවර ගැනීම. • රාජ්‍ය අංශයේ ආයතනවල චිත්‍රපට පවත්වාගෙන යාම පිළිබඳව උපදෙස් ලබා දීම හා ජාතික ලේඛනාගාර නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය), ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ (තාක්ෂණ, ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් ලේඛන) සහ ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී ඉටු කිරීම.

ප්‍රධාන අධිලේඛන ප්‍රතිරූපන නිලධාරී	විශේෂ	01	• ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධිලේඛන හා පුවත්පත්වල ඇති තොරතුරු වෙනත් මාධ්‍යයක තැන්පත් කිරීම, ලේඛන සූක්ෂම ඡායාරූපගත කිරීම මඟින් ඒවායෙහි මතු පැවැත්ම තහවුරු කිරීම, දෙපාර්තමේන්තුවේ සියළුම ඡායාරූපගත කිරීමේ කටයුතු ඉටු කිරීම, සූක්ෂම ඡායාපට පිළිබඳ තත්ත්ව පරීක්ෂාව, අධිලේඛන ප්‍රතිරූපක වරුන්ගේ හා එම අංශයේ අනෙකුත් නිලධාරීන්ගේ රාජකාරී අධීක්ෂණය හා පරිපාලනය, ජාතික ලේඛනාගාර නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ), ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ (තාක්ෂණ, ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් ලේඛන) සහ ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී ඉටු කිරීම.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (අධිලේඛන)	:	01
ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය)	:	01
ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (චිත්‍රපට)	:	01
ප්‍රධාන අධිලේඛන ප්‍රතිරූපන නිලධාරී	:	01

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

ධාරාව	ප්‍රතිශතය
විවෘත	අදාළ නොවේ.
සීමිත	අදාළ නොවේ.
කුසලතා	100 %

7.2. විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.3. සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.4.2 සුදුසුකම් :

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.3 පළපුරුද්ද :

තනතුරු නාමය	අවශ්‍ය පළපුරුද්ද
ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (අධිලේඛන)	ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධිලේඛන සංරක්ෂණ විෂය ක්ෂේත්‍රයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN - 03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම
ප්‍රධාන අධිලේඛන ප්‍රතිරූපන නිලධාරී	ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලේඛන ප්‍රතිරූපන විෂය ක්ෂේත්‍රයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN - 03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා

	සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම
ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (චිත්‍රපට)	ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය දෘශ්‍ය/ චිත්‍රපට සංරක්ෂණ විෂය ක්ෂේත්‍රයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN - 03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම

<u>සටහන</u>

ඉහත වගුවේ සඳහන් තනතුරු සඳහා විශේෂිතව සඳහන් කර ඇති කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළව අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN - 03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ නිලධරයන් සේවයේ නොමැති අවස්ථාවලදී පමණක් පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාව මත, එකී විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුහුණුවීම් ලබා ඇති අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN - 03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ වසර හයක (06) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ නියමිත වැටුප් වර්ධක 06ක් උපයාගෙන ඇති අධිලේඛන විෂය ක්ෂේත්‍රයේ නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවා 7.4.2 යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධරයන් කුසලතා ධාරාව යටතේ බඳවාගනු ලැබේ.

7.4.2.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :

I. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටියට අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN - 03) සේවා ගණයෙහි I වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම

V. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.4.2 හි සඳහන් සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.3 වයස : අදාළ නොවේ

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබා දෙන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙළ මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලබයි.

7.4.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.4.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.4.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

<u>සටහන</u>

1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

2. බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවේ දී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
1. සේවා පළපුරුද්ද (අදාළ මූලික සේවා සුදුසුකම ඉක්මවා සපුරා ඇති සක්‍රීය හා සතුටුදායක සේවා කාලය)	50	අදාළ නොවේ.
2. කුසලතාවය (අවස්ථානුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පරිපාටිය අනුව කුසලතාව තීරණය කරනු ලැබේ.)	45	
3. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව	05	
එකතුව	100	

7.4.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර නිවේදනයක් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

08. කාර්යක්ෂමතා කඩඉම් : අදාළ නොවේ.

09. භාෂා ප්‍රවීණතාව : ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

10. ශ්‍රේණි උසස් කිරීම : අදාළ නොවේ.

11. තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි: ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවෙහි දැක්වෙන අනෙකුත් පොදු කොන්දේසි අදාළ වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

"සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව වේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

සකස් කළේ	:	පරීක්ෂා කළේ	:
අත්සන	:.....	අත්සන	:.....
නම	: බී.ඒ.ඩබ්ලිව්.ඩබ්ලිව්. අබේනායක	නම	: ආර්.එම්. රොෂාණි එස්. තිලකරත්න
තනතුර	: කළමනාකරණ සේවා නිලධාරි III	තනතුර	: සහකාර අධ්‍යක්ෂ (පාලන)
දිනය	: 2021.10.21	දිනය	: 2021.10. 21

ආර්.එම්. රොෂාණි එස්. තිලකරත්න
ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (පාලන)
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
නො. 07, පිලිප් ගුණවර්ධන මාවත
කොළඹ 07

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :.....
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ආචාර්ය නදීරා රූපසිංහ

තනතුර : ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2021.10. 26

නිල මුද්‍රාව :

ආචාර්ය නදීරා රූපසිංහ
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
අංක. 07, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

යොමු අංකය :.....

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) අධිපන්තිය සේවා ගණය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :.....
නම :.....

ලේකම්,
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

දිනය : 2021.

නිල මුද්‍රාව :

යොමු අංකය :.....

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) අධිපන්තිය සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය ..... දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :.....
නම :.....

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2021.

නිල මුද්‍රාව :

උපලේඛනය 01

01. විභාගයේ නම : ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
1. සේවා පළපුරුද්ද (අදාළ මූලික සේවා සුදුසුකම ඉක්මවා සපුරා ඇති සක්‍රීය හා සතුටුදායක සේවා කාලය)	50	අදාළ නොවේ.
2. කුසලතාවය (අවස්ථානුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පරිපාටිය අනුව කුසලතාව තීරණය කරනු ලැබේ.)	45	
3. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව	05	
එකතුව	100	

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

04. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : අවශ්‍යතාවය පරිදි වර්ෂයකට එක් වරක්

සකස් කළේ :
අත්සන : .....
නම : බී.ඒ.ඩබ්ලිව්.ඩබ්ලිව්. අබේනායක
තනතුර : කළමනාකරණ සේවා නිලධාරී III
දිනය : 2021.10. 21

පරීක්ෂා කළේ :
අත්සන : .....
නම : ආර්.එම්. රොෂාණි එස්. තිලකරත්න
තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)
දිනය : 2021.10. 21

ආර්.එම්. රොෂාණි එස්. තිලකරත්න
ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (පාලන)
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
නො. 07, පිලිප් ගුණවර්ධන මාවත
කොළඹ 07

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : .....
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ආචාර්ය නදීරා රූපසිංහ
තනතුර : ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2021.10. 26

ආචාර්ය නදීරා රූපසිංහ
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
අංක. 07, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපෑල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No. PSC/EST/02-01-34/04/2017

ඔබේ අංකය / உமது இல. / Your No. CA/1/1/18/6/1

දිනය / திகதி / Date 2021.08. 10

DNA / ADMIN
04 OCT 2021
DNA/2/MS07/DMD

ලේකම්,
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධිපන්තිය (MN 07) සඳහා බඳවා ගැනීම

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2021.04.20 දිනැති ලිපිය හා බැඳේ.

02. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධිපන්තිය (MN 07) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට, මේ සමඟ අමුණා ඇති ඇමුණුමේ (පිටු 01කින් යුක්ත) සඳහන් සංශෝධනයන් ඇතුලත් කිරීමට 2021.08.06 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

03. තවද, එම බඳවා ගැනීමේ පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සහතික කර ඇති බැවින්, නැවත සහතික කිරීමක් අවශ්‍ය නොවන අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සිදු කරන ලද සංශෝධනය සටහන් කර ගැනීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

ආර්.ඩී.පී.එස්.ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්:

1. ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව - කාරු.දැ.ගැ.ස.
2. ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව - කාරු.දැ.ගැ.ස.
3. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කාරු.දැ.ගැ.ස.

සංශෝධන ලැයිස්තුව

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධිපන්තිය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

අනු අංකය	ඡේද අංකය	සංශෝධනය විය යුතු ආකාරය
1	1.1	යොමු අංකය : ජාලේ 7/1/3/1 දිනය : 2017.03.02 DNA/2/MA7/2/11 2020.10.23
2	1.2	අධ්‍යාපන අමාත්‍යාංශය යොමු අංකය : ED/5/67/26/02/13 දිනය: 2017.04.11 බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යොමු අංකය : CA/1/1/18/6/1 දිනය : 2020.12.21
3	1.4	යොමු අංකය : EST-02/RECRU/02/0295 දිනය: 2017.06.05 EST-02/RECRU/02/0295 2019.09.19
4	1.6	යොමු අංකය: PSC/EST/02-01-34/04/2017 දිනය : 2017.11.28 පළමු සංශෝධනය : (රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සංශෝධනය අනුමත කරන දිනය ඇතුලත් කරන්න)
5	7.4.2.3	මේ යටතේ ඇතුලත් වගුවට පහලින් පහත සටහන ඇතුලත් කරන්න. **සටහන** ඉහත වගුවේ සඳහන් තනතුරු සඳහා විශේෂිතව සඳහන් කර ඇති කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළව අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ නිලධරයන් සේවයේ නොමැති අවස්ථාවලදී පමණක් පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාව මත, එකී විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුහුණුවීම් ලබා ඇති අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ වසර හයක (06) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ නියමිත වැටුප් වර්ධක 06ක් උපයාගෙන ඇති අධිලේඛන විෂය ක්ෂේත්‍රයේ නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවා 7.4.2 යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධරයන් කුසලතා ධාරාව යටතේ බඳවාගනු ලැබේ.
6	7.4.2.5	I. උසස්කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
7	7.4.5	අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර නිවේදනයක් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ., යනුවෙන් සංශෝධනය කරන්න.